ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය
தேசிய மொழிகள் சமத்துவ மேம்பாட்டுச் செயற்றிட்டம்
National Languages Equality Advancement Project

# ජාතික භාෂා අරමුදල

## භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ භාෂා අධ්‍යයනය

## සඳහා

## යෝජනා කැඳවීම

*අයදුම්පත් සඳහා මාර්ගෝපදේශ*

alinea

ශ්‍රී ලංකා රජය
இலங்கை அரசாங்கம்
Government of Sri Lanka

කැනේඩියානු රජයේ අනුග්‍රහය ලද ද්විපාර්ශ්වීය ව්‍යාපෘතිය
கனேடிய அரசாங்கத்தினால் அனுசரணை வழங்கப்பெறும் இருதரப்பு செயற்றிட்டம்
A bilateral project supported by the Government of Canada

Canada
කැනේඩියානු රජය
கனேடிய அரசாங்கம்
Government of Canada
Gouvernement du Canada

**වැදගත් දැනුම් දීම**

මෙම යෝජනා කැඳවීම සීමිත අවස්ථාවකි. ලබා දෙන ආකෘතිය (ඇමුණුම 1A - යෝජනා ආකෘතිය) පදනම් කර අයදුම් කරුවන් විසින් යෝජනා ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. යෝජනා ඇගයීම් ජාලකය (ඇමුණුම 1B - යෝජනා ඇගයීම් ජාලකය) අනුව ඇගයීමේ ක්‍රියාවලියකට භාජනය කරනු ලබයි.

# පටුන

**1. පසුබිම** ........ 2

**2. ජාතික භාෂා අරමුදලේ (NLF) අරමුණ සහ පරමාර්ථ** ........ 3

**3. ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) විසින් සැපයීමට නියමිත අරමුදල්** ........ 5

3.1 යෝජනා කැඳවීම සඳහා වූ නීති රීති සහ ක්‍රියා පටිපාටි ........ 5

3.2 අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටි - සංකල්ප සටහන් අදියර ........ 7

**4. ඇගයීමේ ක්‍රියාවලිය** ........ 7

4.1 ජාතික භාෂා අරමුදල (NLF) සඳහා වූ ක්‍රියාවලිය ........ 7

# ජාතික භාෂා අරමුදල

## භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ භාෂා අධ්‍යයනය සඳහා යෝජනා කැඳවීම අයදුම්පත් සඳහා මාර්ගෝපදේශ

## 1. පසුබිම

විවිධ අංශ සඳහා සංවර්ධන ආධාර සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ යහපැවැත්ම සහ සංවර්ධනය සඳහා සහයෝගය දැක්වීමේ දිගු කාලීන ඉතිහාසයක් කැනේඩියානු රජයට ඇත. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) සාර්ථකව ක්‍රියාත්මක වීම සහතික කිරීම සහ එහි වැඩසටහන් සහ ක්‍රියාකාරකම් වලට ඵලදායී සිවිල් සමාජ හවුල්කාරිත්වයක් සඳහා වූ විවිධ මුල පිරීම් වලට සහාය වීම සඳහා, භාෂා අයිතිවාසිකම් සම්බන්ධ ගැටළු වලදී දශක ගණනාවක් තිස්සේ ලබා දී ඇති තාක්ෂණික සහාය ඉන් ප්‍රධානය වේ.

ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීමේ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කර ඇති, කැනේඩියානු සහ ශ්‍රී ලංකා රජයන් අතර වූ ද්විපාර්ශ්වික ව්‍යාපෘතියක් වන අතර ඇලිනියා ඉන්ටනැෂනල් මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජය සමග, විශේෂයෙන් රාජ්‍ය සෙවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය හා ඊට අනුබද්ධිත ආයතන වන:

- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව (DOL)
- රාජ්‍ය භාෂා කොමිෂන් සභාව (OLC)
- ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය (NILET) සමග එක්ව ක්‍රියාත්මක වේ.

රට තුල දෙමළ භාෂාවේ තත්ත්වය හා සම්බන්ධ වැදගත් වෙනස්කම් වලට මග පාදමින්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඇතුළත් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය (1987) දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් බවට පත් කළ අතර ඉංග්‍රීසි භාෂාව සමබන්ධීකරන භාෂාවක් ලෙස පිළිගත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථා සංශෝධනය (1988) රාජ්‍ය භාෂා (සිංහල සහ දෙමළ) භාවිතය සඳහා අමතර විධිවිධාන සළසා ඇත.

ශ්‍රී ලංකාවේ ගැටුම් වල සන්දර්භය, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී ප්‍රතිපත්තිමය සහ ක්‍රියාවට නැංවීම යන මට්ටම් දෙකෙහිම මෙම හිඩැස්, භාෂාමය දෘෂ්ටි කෝණයකින් පෙන්වා දෙයි[1].

[1] භාෂාව අයිතියක් ලෙස අර්ථ දැක්වීම හා එම අයිතිවාසිකම් සම්පූර්ණ කිරීමට ඉඩ සලසන රජයේ සහ පුරවැසියාගේ යුතුකම් හා වගකීම් සමුදායක් පෙන්වා දෙමින්, ඉහත ව්‍යවස්ථාමය හා නෛතික රාමුව මගින් භාෂා ප්‍රතිපත්තියක් සකස් කර ඇත. තවද, විශේෂයෙන් ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම (2011), උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම (ඔඔසෘක) (2011), සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව (2013), NHRAP (2017) ආදී ප්‍රතිපත්ති නිර්දේශයන් කිහිපයක් මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ හිඩැස් පෙන්වා දෙයි. මෙම නිර්දේශයන්, ජාතික භාෂා ප්‍රතිපත්තිය, විධිවිධාන සමූහයක් පමණක් වීමෙන් ඔබ්බට ගොස්, යහපැවැත්ම නිර්වචනය කිරීමේ සහ සංවර්ධන ඉඩ ප්‍රස්ථාවන්ට ප්‍රවේශවීමේදී මානව හැකියාවන් සඳහා දායක වන්නක් දක්වා රැගෙන යයි. භාෂාව පිළිබඳ මාතෘකාව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ මානව හිමිකම් ඇතුළුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති ක්ෂේත්‍රය එක්සත් කිරීමේ තේමාත්මක අංශයක් දක්වා වර්ධනය වී තිබේ.

ප්‍රතිපත්ති මට්ටමින්, ප්‍රායෝගිකව ඇති පරතරය පැන නගින්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) තුළම භාෂා ගැටලුව පිළිබඳ ප්‍රමාණවත් අර්ථ දැක්වීමක් නොවීම තුලින් වන අතර එය පුරවැසියන්ට ප්‍රජාවේ ආර්ථික, සමාජීය හා දේශපාලන ජීවිතයට සහභාගී වීමේ මාධ්‍යයක් ලෙස නොව, සේවා සැපයීම සඳහා වූ මාධ්‍යයක් ලෙස සැලකීම නිසාවෙනි. එය ක්‍රියාත්මක කිරීමේදී, පුරවැසි අවශ්‍යතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ගොඩනැගීම සහ සහාය දීම, පැමිණිලි ආමන්ත්‍රණය කිරීම සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා පුරවැසියන්ගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය සහ සිවිල් සමාජ කණ්ඩායම් අතර සහයෝගීතාවයන් ප්‍රමාණවත් නොමැත.

## 2. ජාතික භාෂා අරමුදලේ (NLF) අරමුණ සහ පරමාර්ථ

මෙම අරමුදලේ මූලික පරමාර්ථය වනුයේ ශ්‍රී ලාංකික පිරිමින්, කාන්තාවන් සහ යෞවනයන් විසින් ඔවුන්ගේ රටේ සංස්කෘතිකමය වශයෙන් විවිධාකාර ස්වභාවය හා ද්විභාෂා ස්වභාවය පිළිගැනීම වර්ධනය කිරීම සහ ප්‍රතිසන්ධානය සඳහා භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමයි.

ජාතික භාෂා අරමුදල (NLF) සඳහා ප්‍රධාන අරමුණු දෙකකි:

i. ජාතික ඒකාබද්ධතාවය හා සංහිඳියාව සඳහා භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන වල ධාරිතාව ඉහළ නැංවීම. මේ සම්බන්ධයෙන් ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) විසින්,
   - ජාතික ඒකාබද්ධතාවය සහ සංහිඳියාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය මත භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම;
   - රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) ක්‍රියාත්මක කිරීමේදී සහභාගීත්වය සහ සහාය දැක්වීම ප්‍රවර්ධනය කරන අතර භාෂා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම;
   - විවිධත්වය පෝෂණය කරමින් සහ භාෂා අයිතිවාසිකම් සම්බන්ධ ගැටළු පිළිබඳ සාකච්ඡාවලට ඇතුළත් කරමින්, සිවිල් සමාජ සංවිධාන (CSO) සහ අදාළ රාජ්‍ය ආයතන අතර උපදේශනය තුළින් සහයෝගීතාව පහසු කිරීම සඳහා සංසද/සම්මන්ත්‍රණ/වැඩමුළු පිහිටුවීම;
   - රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) සඳහා රාජ්‍ය ආයතනවල අනුකූලතාවයට සාපේක්ෂ පැමිණිලි ක්‍රියා පටිපාටි පිළිබඳව සංවිධානවලට වඩා හොඳින් දැනුම් දීම;

   යනාදිය[2] සඳහා සිවිල් සමාජ සංවිධාන හා ආයතන වෙත අරමුදල් සපයනු ඇත.

ii. පුරවැසියන්ට (කාන්තාවන්ට සහ පිරිමින්ට) රාජ්‍ය භාෂාවලින් සන්නිවේදනය කටයුතු කිරීමට සහාය වීම සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධානවල ධාරිතාව වැඩි කිරීම. පහත දැක්වෙන ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සහජීවන සමිති සමග වැඩ කිරීමේ ශක්තිමත් ක්‍රමවේදයක් නිරූපණය කරන සිවිල් සමාජ සංවිධාන (CSO) වෙත ලබා දෙන ප්‍රදාන මගින් මෙම අරමුණ සාක්ෂාත් වේ:

---

[2] යෝජනා ශක්තිමත් කිරීමට, යෞවන හා කාන්තා සංවිධාන සමග සම්බන්ධ වීම/කටයුතු කිරීම අවධාරණය කිරීම හා සංවිධාන අතර උපායමාර්ගික හවුල්කාරිත්වයන් හේතු වේ.

- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ වැඩි දැනුවත් වීමක් සහ එහි ප්‍රවර්ධනය සඳහා වැඩිදියුණු කළ සම්බන්ධීකරණය සහ පාලනය තුළින් වඩාත් කාර්යක්ෂමව, ඵලදායී ලෙස හා ඇතුලත්කරණයකින් යුතුව කටයුතු කිරීම;
- දෙවන භාෂා පුහුණුව ලබා දීම සඳහා අභ්‍යන්තර ධාරිතාව වැඩි දියුණු කිරීමට මෙවලම් සහ සම්පත් සංවර්ධනය කිරීම;
- දෙවන භාෂා ඉගෙනීම සඳහා කාන්තාවන් සහ යෞවනයන් ඇතුළු සාමාන්‍ය ජනතාව පුහුණු කිරීම සහ සහාය දීම සඳහා අභ්‍යන්තර ධාරිතාව වැඩි කිරීම;
- කාන්තාවන් සහ යෞවනයන් ඇතුළු සාමාන්‍ය ජනතාවට දෙවන භාෂා පුහුණුව ලබා දීමේ ප්‍රවේශය වැඩිදියුණු කිරීම;

**මෙම යෝජනා කැඳවීමේදී, අයදුම්පත් ඉහත දැක්වූ ප්‍රධාන මූලික අරමුණු දෙක යටතේ කාණ්ඩ කිරීමකට ලක් කළ හැකි අතර, විශේෂයෙන් පහත දක්වා ඇති තේමා යටතට අයත් විය යුතුයි.**

**1. භාෂා අයිතීන් පිළිබඳ ජාතික කතිකාවතක් ප්‍රවර්ධනය කිරීම:** මේ සඳහා අයත් වන ව්‍යාපෘතීන් මගින් සිවිල් සමාජ ක්‍රියාකාරීන් හට එක්ව යහපත් භාවිතයන්, අභියෝග සහ ස්ත්‍රී - පුරුෂ සමාජ භාවයන්ට සංවේදීව ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් ප්‍රවර්ධනය කරන ක්‍රමවේදයන් වේ. උදාහරණ ලෙස, සම්මන්ත්‍රණ සහ සම්මුති අඛණ්ඩ සබඳතා ඇති ජාලයක් බවට පරිවර්තනය කිරීම. මේ සඳහා මාර්ගගත යටිතල පහසුකම් සපයන යෝජනාවලි ඉදිරිපත් කිරීම දිරිමත් කෙරේ.

**2. ජංගම නෛතික සායන:** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සිදු කරන ව්‍යාපෘති, ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ලෙස දක්වන අතර එමගින් මහජනයාට තම භාෂා අයිතීන් බලාත්මක කර නීතිමය සහය සහිතව පෝරම පිරවීම, භාෂා කොමිසම වෙත පැමිණිලි ගොනු කිරීම සහ 1956 යන ඇමතුම් මධ්‍යස්ථාන අංකය භාවිතාව ප්‍රවර්ධනය කිරීම ඇතුළත් වන යෝජනාවලි ඉදිරිපත් කිරීම දිරිමත් කෙරේ.

**3. භාෂා අයිතීන් ප්‍රවර්ධනය සඳහා මහජනතාව දැනුවත් කිරීමේ අංග භාවිතාව:** සන්නිවේදන මාධ්‍යන් වැඩි දියුණු කිරීම තුළින් භාෂා අයිතීන් පළිබඳ දැනුවත් කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්ට සංවේදීව ශ්‍රී ලංකාවේ ද්විභාෂා විවිධත්වය සමරන කථාන්දර ගොඩනගන ව්‍යාපෘතීන් මෙයට අයත් වේ. උදාහරණ ලෙස කෙටි චිත්‍රපට, සමාජ මාධ්‍ය සම්බන්ධ නිෂ්පාදන, ප්‍රකාශන සහ අනෙකුත් ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය ඇතුළත් වන යෝජනාවලි ඉදිරිපත් කිරීම දිරිමත් කෙරේ.

**4. සහජීවන සංගම් පොකුරු:** වර්තමානයේ NLF විවිධ ප්‍රදේශ වල බොහෝ ව්‍යාපෘතීන්ට ආධාර ලබා දෙමින් සිටින අතර ඒවා මගින් බොහෝ සහජීවන සංගම් වලට පොකුරු ලෙස එක් වීමට පාලන ව්‍යුහයක් ලබා දෙනු ලැබේ. මෙමගින් එම සංගම් වලට භාෂා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන සම්පත් එක් රැස් කිරීම සිදු කිරීම අදහස් වේ. එසේම ඔවුන්ගේ ක්‍රියාකාරීවීමේ ආයතනික ධාරිතාවය ද ශක්තිමත් කළ හැක. NLEAP, එමගින් භූගෝලීය පරතරයන් ඉවත් කරන අතර, එවැනි ඉහත සඳහන් හා සමාන පාලන ව්‍යුහ භාෂා සමාජයන් සඳහා ගොඩනගා ගැනීම සිදු කරන ව්‍යාපෘතීන් සඳහාද අවස්ථාව පවතී. (ඇමුණුම II හි පළමු කැඳවීම යටතේ පවතින ව්‍යාපෘති ප්‍රදේශයන් දක්වා ඇත)

**5. සහජීවන සංගම් පිළිබඳ පර්යේෂණ/සමීක්ෂණ:** වර්තමාන සහජීවන සංගම් පිළිබඳව හා එම සංගම් හරහා අනාගතයේ භාෂා ප්‍රවර්ධනය කිරීම, භාෂා ඉගෙනීම, ලංකාවේ ද්විභාෂා විවිධත්වය සැමරීම සඳහා වූ ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ/සමීක්ෂණ පවත්වා ඒ පිළිබඳව වාර්ථා සකස්කරන ව්‍යාපෘතීන්.

**6. දෙවන භාෂා ඉගෙනීම:** භූගෝලීයව හඳුනාගත් දෙවන භාෂා ඉගැන්වීමේ ව්‍යාපෘතීන් (කරුණාකර ඇමුණුම ii හි පළමු කැඳවීම යටතේ ඇති ව්‍යාපෘති ප්‍රදේශ නිරීක්ෂණය කරන්න)

**7. OLP සබැඳි පර්යේෂණ හා අධ්‍යන:** OLP හා සබැඳි ගැටළු පිළිබඳ කරන පර්යේෂණ හා අධ්‍යනයන් ඇතුළත් ව්‍යාපෘතීන් අයත් වේ.

## 3. ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) විසින් සැපයීමට නියමිත අරමුදල්

ප්‍රදානයන් කළමනාකරණය කිරීමේ හැකියාව පෙන්නුම් කරන සහ 2 හි දක්වා ඇති පරිදි අරමුණු සපුරාලන සුදුසුකම් ලත් සිවිල් සමාජ සහ වෙනත් සංවිධාන වලට ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) විසින් මූල්‍ය ආධාර සපයනු ඇත. අරමුණු ප්‍රවර්ධනය කරන අයුරින් සහ මුදල් සඳහා වටිනාකමක් ලබා දෙන අයුරින් අරමුදල් දැඩි ලෙස කළමනාකරණය කිරීමට ඇති සූදානම මෙම සංවිධාන විසින් පෙන්නුම් කළ යුතුය. රුපියල් මිලියන දහයක් (රු. මිලියන 10) දක්වා සහ මාස 12 ක් හෝ 15ක් දක්වා වූ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුවක් සහිත මුලපිරීම් සඳහා අරමුදල් සම්පාදනය කිරීමට ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) සූදානම්ය.

### 3.1 යෝජනා කැඳවීම සඳහා වූ නීති රීති සහ ක්‍රියා පටිපාටි

නිර්ණායක තුනක් මත පදනම්ව අරමුදල් ලැබීමට සුදුසුකම් ස්ථාපිත කෙරේ: (1) සංවිධානයේ සුදුසුකම; (2) ඉදිරිපත් කරන ලද සංකල්පයේ අදාළත්වය සහ හවුල්කාරීත්ව සැලසුම; (3) සුදුසුකම් ලත් පිරිවැය පිළිබඳ විස්තරය.

**සංවිධානයේ සුදුසුකම් සඳහා වන නිර්ණායක**

| | සංවිධානය | නිර්ණායක |
|---|---|---|
| 01 | රාජ්‍ය නොවන සංවිධාන [3] (NGOs) | • නිසි පරිදි ලියාපදිංචි වූ සංවිධානයක් වීම සහ ශ්‍රී ලංකාවේ නීතීන් ඉදිරියේ නීතිමය පුද්ගලයකු වීම, ලාභ නොලබන හෝ පුණ්‍යායතනයක් හෝ වෙනත් සංවිධානයක් වීම.<br>• අවම අවුරුදු 3 ක් ක්‍රියාත්මකව තිබීම<br>• ව්‍යාපෘති/වැඩසටහන් කළමනාකරණයේ හැකියාව පෙන්නුම් කර තිබීම<br>• මූල්‍ය කලමානකරණය පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් තිබීම හා සංවිධානය සඳහා යහපත් විගණනය කරන ලද වත්මන් මූල්‍ය ප්‍රකාශන පෙන්වීමේ හැකියාව<br>• භාෂා අයිතිවාසිකම්, භාෂා ඉගෙනීම, භාෂා සේවා, ගැටුම් මැදිහත්කරණය, ජාතික ඒකාබද්ධතාවය සහ ප්‍රතිසන්ධානය සම්බන්ධ ව්‍යාපෘති, වැඩසටහන්, අධ්‍යයන සහ පර්යේෂණ ඇතුළු එලදායී වැඩසටහන්කරණය පිළිබඳ පිළිගත් පසුබිමක් තිබීම<br>• ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්දැකීම් ඇති අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, විශේෂයෙන් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම.<br>• යෝජිත මුලපිරුමට ස්වභාවමය සහ/හෝ මූල්‍යමය දායකත්වයක් සැපයිය හැකි වීම |
| | | • නිසි පරිදි ලියාපදිංචි වූ සංවිධානයක් වීම සහ ශ්‍රී ලංකාවේ නීතීන් ඉදිරියේ නීතිමය පුද්ගලයකු වීම, ලාභ නොලබන හෝ පුණ්‍යායතනයක් හෝ වෙනත් සංවිධානයක් වීම.<br>• අවම අවුරුදු 3 ක් ක්‍රියාත්මකව තිබීම<br>• ව්‍යාපෘති/වැඩසටහන් කළමනාකරණයේ හැකියාව පෙන්නුම් කර තිබීම |

[3]1980 අංක 31 දරණ ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණය කිරීමේ) පනත (සංශෝදිත) යටතේ ලියාපදිංචි වී තිබීම හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි වී තිබීම.

| | | |
|---|---|---|
| 02 | වෘත්තීමය සංගම් | • මූල්‍ය කලමානකරණය පිලිබඳ යහපත් ප්‍රතිරූපයක් තිබීම හා සංවිධානය සඳහා යහපත් විගණනය කරන ලද වත්මන් මූල්‍ය ප්‍රකාශන පෙන්වීමේ හැකියාව<br>• භාෂා අයිතිවාසිකම්, භාෂා ඉගෙනීම, භාෂා සේවා, ගැටුම් මැදිහත්කරණය, ජාතික ඒකාබද්ධතාවය සහ ප්‍රතිසන්ධානය සම්බන්ධ ව්‍යාපෘති, වැඩසටහන්, අධ්‍යයන සහ පර්යේෂණ ඇතුළු ඵලදායී වැඩසටහන් කරණය පිලිබඳ පිලිගත් පසුබිමක් තිබීම<br>• ස්ත්‍රී පුරුෂ භාවය පිලිබඳ සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ අත්දැකීම් ඇති අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, විශේෂයෙන් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම.<br>• යෝජිත මුලපිරුමට ස්වභාවමය සහ / හෝ මූල්‍යමය දායකත්වයක් සැපයිය හැකි වීම |
| 03 | ප්‍රජා මූලික සංවිධාන | • නිසි පරිදි ලියාපදිංචි වූ සංවිධානයක් වීම සහ ලාභ නොලබන හෝ පුණ්‍යායතනයක් හෝ වෙනත් සංවිධානයක් වීම<br>• අවම අවුරුදු 2 ක් ක්‍රියාත්මකව තිබීම<br>• ව්‍යාපෘති/වැඩසටහන් කළමනාකරණයේ හැකියාව පෙන්නුම් කර තිබීම<br>• මූල්‍ය කලමානකරණය පිලිබඳ යහපත් ප්‍රතිරූපයක් තිබීම හා සංවිධානය සඳහා යහපත් විගණනය කරන ලද වත්මන් මූල්‍ය ප්‍රකාශන පෙන්වීමේ හැකියාව<br>• භාෂා අයිතිවාසිකම්, භාෂා ඉගෙනීම, භාෂා සේවා, ගැටුම් මැදිහත්කරණය, ජාතික ඒකාබද්ධතාවය සහ ප්‍රතිසන්ධානය සම්බන්ධ ව්‍යාපෘති, වැඩසටහන්, අධ්‍යයන සහ පර්යේෂණ ඇතුළු ඵලදායී වැඩසටහන් කරණය පිලිබඳ පිලිගත් පසුබිමක් තිබීම<br>• ස්ත්‍රී පුරුෂ භාවය පිලිබඳ සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ අත්දැකීම් ඇති අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, විශේෂයෙන් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම<br>• යෝජිත මුලපිරුමට ස්වභාවමය සහ/හෝ මූල්‍යමය දායකත්වයක් සැපයිය හැකි වීම |
| 04 | අධ්‍යයන / පර්යේෂණ ආයතන | • විශ්වවිද්‍යාල හෝ සරසවි මගින් පිළිගෙන තිබීම හා පර්යේෂණ ආයතනයක් ලෙස ලියාපදිංචි වී තිබීම හා සහ ලාභ නොලබන හෝ පුණ්‍යායතනයක් හෝ වෙනත් සංවිධානයක් වීම<br>• අවම අවුරුදු 2 ක් ක්‍රියාත්මකව තිබීම<br>• ව්‍යාපෘති/වැඩසටහන් කළමනාකරණයේ හැකියාව පෙන්නුම් කර තිබීම<br>• මූල්‍ය කලමානකරණය පිලිබඳ යහපත් ප්‍රතිරූපයක් තිබීම හා සංවිධානය සඳහා යහපත් විගණනය කරන ලද වත්මන් මූල්‍ය ප්‍රකාශන පෙන්වීමේ හැකියාව<br>• භාෂා අයිතිවාසිකම්, භාෂා ඉගෙනීම, භාෂා සේවා, ගැටුම් මැදිහත්කරණය, ජාතික ඒකාබද්ධතාවය සහ ප්‍රතිසන්ධානය සම්බන්ධ ව්‍යාපෘති, වැඩසටහන්, අධ්‍යයන සහ පර්යේෂණ ඇතුළු ඵලදායී වැඩසටහන් කරණය පිලිබඳ පිලිගත් පසුබිමක් තිබීම<br>• ස්ත්‍රී පුරුෂ භාවය පිලිබඳ සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ අත්දැකීම් ඇති අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, විශේෂයෙන් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම යන කරුණු වාසිදායී විය හැකියි<br>• යෝජිත මුලපිරුමට ස්වභාවමය සහ / හෝ මූල්‍යමය දායකත්වයක් සැපයිය හැකි වීම |

## වැදගත් දැන්වීමයි:

- පළමු කැඳවීමේදී මූල්‍යාධාර ලබා ගත් ආයතන මෙම කැඳවීමට අයැදුම් කිරීම සඳහා සුදුසු කම් නොලබයි.
- ඉහත සඳහන් තේමා එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට අදාල වන පරිදි යෝජනාවන් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත (2 - පිටු 4/5)

## 3.2 අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටි - සංකල්ප සටහන් අදියර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති (OLP) මුලපිරීමක් සඳහා අරමුදල් ලැබීමට කැමති සුදුසුකම් ලත් සංවිධාන වලට ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමට ආරාධනා කෙරේ. ව්‍යාපෘති යෝජනාව, 2 හි දක්වා ඇති අරමුණ/ණු වලට අනුකූලව සකස් කළ යුතු අතර මෙම RFP හි ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රයට (ඇමුණුම IA) අනුකූල විය යුතුය. ව්‍යාපෘති යෝජනාව ආකෘති පත්‍රය අපගේ ව්‍යාපෘති වෙබ් අඩවිය වන www.nleap.lk වෙතින් බාගත කර **ජනවාරි 18, 2021** දින හෝ ඊට පෙර nlf@nleap.lk හරහා ව්‍යාපෘති නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කළ හැකිය.

සපයන ලද ව්‍යාපෘති යෝජනා ඇගයීම් ජාලකය (ඇමුණුම IB) මත පදනම්ව ජාතික භාෂා අරමුදල් ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලැබේ.

## 4. ඇගයීමේ ක්‍රියාවලිය

ලැබෙන අයදුම්පත් ඉහත 2 හි සඳහන් මූලික සුදුසුකම් නිර්ණායකයන් මත මුලින්ම පරීක්ෂා කරනු ලබන අතර, යෝජනාවේ නිරවද්‍යතාවය පිළිබඳ පරිපාලන පරීක්ෂණද සිදු කරනු ලබයි. ඇගයීම් කමිටුව (EC) විසින් ව්‍යාපෘති යෝජනා ඇගයීම සඳහා සුදුසුකම් ලත් අයදුම්පත් තෝරා ගනු ලැබේ. ඇගයීම් කමිටුව (EC) විසින් ඇගයීම් ජාලකය (ඇමුණුම IB) මත පදනම්ව ඇගයීම සිදු කරනු ලබන අතර ඇගයීම් ප්‍රතිඵල ව්‍යාපෘති යෝජනා අනුමත කමිටුවට (PPAC) ඉදිරිපත් කරයි. ඊ ළඟ පියවරයන් දැනුම් දීම සඳහා තෝරාගනු ලැබූ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කල සංවිධාන අප විසින් අමතනු ඇත.

## 4.1 ජාතික භාෂා අරමුදල (NLF) සඳහා වූ ක්‍රියාවලිය

**පළමු අදියර - යෝජනා කැඳවීම**

| | |
|---|---|
| **අවසන් දිනය** | ජනවාරි 18, 2021 |

**දෙවන අදියර - ව්‍යාපෘති සමාලෝචනය/ඇගයීම/අනුමැතිය**

| **ඇගයීම** | **PPAC අනුමැතිය** |
|---|---|
| ජනවාරි 22 - පෙබරවාරි 12, 2021 | පෙබරවාරි 12 - 19, 2021 |

**තුන්වන අදියර: අවසාන අනුමැතිය**

පෙබරවාරි 22 - මාර්තු 01, 2021

ජාතික භාෂා අරමුදල (NLF)
ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP)
දෙසැම්බර් 18, 2020